# ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# ජාතික ප්‍රසම්පාදන ඇරයුමයි

**විද්‍යාගාර උපකරණ මිලදී ගැනීම - වෛද්‍ය පීඨය**

**ACCELERATING HIGHER EDUCATION EXPANSION AND DEVELOPMENT (AHEAD) PROJECT**

1. ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයීය ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් පහත සඳහන් කාණ්ඩ යටතේ අයිතමයන් සැපයීමට සුදුසුකම්ලත් ලියාපදිංචි වී ඇති පළපුරුදු ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ මිල ගණන් සඳහා ඇරයුම් කර සිටී.

| *Tender Name & Number* | *Items* |
| --- | --- |
| *AHEAD/SUSL/FOM/2018/09* | Laboratory Equipment |

**සැලකිය යුතුයි : භාණ්ඩ ලේඛනය හා පිරිවිතර සබරගමුව විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙන් ලබා ගත හැක. (www.sab.ac.lk → Notices)**

2. ජාතික තරඟකාරී මිල ගණන් යටතේ මෙම මිලදී ගැනීම සිදුකෙරේ.

3. මේ සඳහා කැමැත්තක් දක්වන සුදුසුකම්ලත් ආයතන විසින් අවශ්‍ය තොරතුරු **2018.10.29** දින සිට **2018.11.16** දින දක්වා සතියේ වැඩ කරන දිනවල **පෙ.ව 9.00 සිට ප.ව. 3.00 දක්වා** ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් තාක්ෂණික ලේකම් කාර්යාලයේ (OTS Office) AHEAD ව්‍යාපෘති නියෝජ්‍ය අධ්‍යක්ෂ / ප්‍රසම්පාදන වෙතින් ලබාගත හැකි අතර විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් තාක්ෂණික ලේකම් කාර්යාලයේදී අදාල ලේඛන පරීක්ෂා කළ හැකිය.

4. ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ සරප් වෙත රු 2,000.00 ක ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවා එම ලදුපත සමග ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් **2018.10.29 දින සිට 2018.11.16** දින දක්වා සතියේ වැඩ කරන දිනවල **පෙ.ව 9.00 සිට ප.ව. 3.00 දක්වා** ඉංග්‍රීසි භාෂාවෙන් සකසන ලද සම්පූර්ණ ලේඛන කට්ටලයක් ලබාගත හැක.

5. සියලුම ලංසු සඳහා මුල් පිටපත හා අනු පිටපත ලෙස සලකුණු කළ කට්ටල දෙකක් වෙන වෙනම මුද්‍රා තබා ලිපි කවර වල බහා ඒවා නැවත තනි ලිපි කවරයකට බහා මුද්‍රා තබා ලංසුවේ නම, අංකය ලිපි කවරයේ ඉහල වම් කෙළවරේ සඳහන් කර ඉදිරිපත් කලයුතුය.

6. සම්පූර්ණ කරන ලද ලංසු ලේඛන **සභාපති, ප්‍රසම්පාදන කමිටුව, මෙහෙයුම් තාක්ෂණික ලේකම් කාර්යාලය** (AHEAD **ව්‍යාපෘතිය), ශ්‍රී ලංකා සබරගමුව** විශ්වවිද්‍යාලය, **බෙලිහුල්ඔය, 7014**0 යන ලිපිනයට **2018.11.19** දින **පෙ.ව 10.00** හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනවිත් භාරදීම කළ හැකිය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉදිරිපත් කරන ලද ලංසු එදිනම **පෙ.ව 10.15** ට ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරිපිටදී විවෘත කරනු ලැබේ.

7. විශ්වවිද්‍යාලයේ ප්‍රසම්පාදන කමිටු තීරණය අවසාන තීරණය වන අතර ඕනෑම ලංසුවක් කිසිදු දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය සතුවේ. මිල ගණන් කැඳවන ලද අයිතමයන්ගෙන් මිලදී ගන්නා ප්‍රමාණය අඩු / වැඩි කිරීම විශ්වවිද්‍යාලයේ අභිමතය පරිදි වේ.

8. මේ සම්බන්ධව වැඩිදුර තොරතුරු 045-2280005 ඇමතීමෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂ / ප්‍රසම්පාදන මෙහෙයුම් තාක්ෂණික ලේකම් කාර්යාලය (**AHEAD ව්‍යාපෘතිය**), ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය වෙතින් ලබාගත හැකිය.

සභාපති,
ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය,
බෙලිහුල්ඔය,70140